# දේව මාතාවන් එළිසබෙත් තුමිය බැහැදැකීම
## මංගලයය

## පළමුවන දේව ප්‍රකාශනය රෝම 12: 9–16

*ශුද්ධ වූ පාවුලු තුමන් විසින් රෝමවරුන්ට ලියන ලද හසුනෙන් උපුටා ගත් කොටසකි.*

"සැදැහැවතුන්ගේ ඕනෑකම් වලදී උපකාර කරන්න. ආගන්තුක සත්කාරයට ලැදිව සිටින්න."

ප්‍රේමය අවංක වේ වා! නපුර පිළිකුල් කොට, යහපතට ඇලුම් වන්න. සුහද සහෝදර ප්‍රේමයෙන් එකිනෙකාට ප්‍රේම කරන්න. ගෞරවයෙන් තමාට වඩා අනෙක් අය උතුම් කොට සලකන්න. අලසකමින් තොර ව, කාර්යශීලී වන්න: උද්යෝගිමත් හදකින් සමිඳාණන් වහන්සේට සේවය කරන්න: බලාපොරොත්තුවෙහි ප්‍රීති වන්න: විපතේ දී ඉවසිලිමත් වන්න: යාච්ඤාවෙහි නොකඩවා යෙදෙන්න: සැදැහැවතුන්ගේ ඕනෑඑපාකම් වලදී උපකාර කරන්න. ආගන්තුක සත්කාරයට ලැදි ව සිටින්න.

ඔබට පීඩා කරන්නන්ට ආශීර්වාද කරන්න, සාප නොකර ආශීර්වාද ම කරන්න. ප්‍රීති වන්නන් සමග ප්‍රීති වන්න, ශෝක වන්නන් සමග ශෝක වන්න. හැම දෙනා සමග එක්සිත් ව ඉන්න, අහංකාර නොවී, යටහත් පහත් අය ආශ්‍රය කරන්න. ඔබ ප්‍රඥාවන්ත යයි සිතා උඩඟු නොවන්න.

*දේව වචනය මෙසේ ය.*

*හෝ*

## පළමුවන දේව ප්‍රකාශනය ශෙපනියා 3: 14–18

*ශෙපනියා දිවැසිවරයාගේ පොතෙන් උපටා ගත් කොටසකි.*

"ඉශ්රායෙල් රජාණන් වන ස්වාමින් වහන්සේ ඔබ අතර වැඩ සිටින සේක."

"සියොන් පුරගන, සොම්නසින් ගී ගයන්න: ජෙරුසලම් වැසියෙනි, කැමොරගසන්න: ඉශ්රායෙල් ජනයෙනි, ප්‍රීති ප්‍රමෝද වන්න. සමිඳාණෝ ඔබට විරුද්ධ ව තිබුණු තඩු තීන්දු අවලංගු කළ සේක: ඔබේ සතුරන් නෙරපාදැමූ සේක: ඉශ්රායෙල්හි රජ වන සමිඳාණෝ ඔබ සමග සිටින සේක. විපතට බිය වීමක් තවත් නැත." එදින ජෙරුසලම මෙසේ කියනු ඇත. "සියොන් නගරය, බිය නොවන්න: ඔබ අත දුබල වන්නට ඉඩ නාරින්න. ඔබේ දෙවි සමිඳාණෝ ඔබ සමග ය: ඔබට ජය අත් කර දෙන සෙබළාණෝ ය. එතුමාණෝ ඔබ ගැන ප්‍රිය මනාප වන සේක: සිය පෙමින් ඔබට නව ජීවනයක් දෙන සේක: ඔබ ගැන සොම්නස් සිතින් ගී ගයන සේක: මංගල දවසක් මෙන් ප්‍රීති වන සේක: ඔබ නින්දාව නොලබන පිණිස ඔබ අතර විනාශය පහකරන සේක."

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය යෙසායා 12: 2–6

පිළිතුර : උතුම් වූ ශුද්ධ දෙවිඳාණෝ ඔබ අතර වැඩසිටින සේක.

ගීය : දෙවිඳාණෝ මාගේ ගැළැවීම ය.
මම එතුමාණන් කෙරෙහි විශ්වාසය තබමි:
එතුමන් කෙරෙහි මට බියක් නැත.
මන්ද, සමිඳාණෝ මාගේ ශක්තියත, ගීතිකාවත් ය.
එතුමාණෝ මාගේ ගැළැවීම ය.

ඔබ ගැලවීමේ ලිංවලින් ප්‍රීතියෙන් දිය ඇදගන්නහු ය.
ඒ දවසේ දී සෙනග මෙසේ පැසසුම් ගී ගයන්නෝ ය.
"සමිඳුන්ට තුති පුදන්න: එතුමන්ගේ නම පවසා අයැදින්න.

එතුමන්ගේ ක්‍රියා ජාතීන් අතර පවසන්න.
එතුමන්ගේ නාමයේ ශ්‍රේෂ්ඨත්වය ප්‍රකාශ කරන්න.
සමිඳුන් කළ අරුමපුදුම දේ නිසා පසස් ගී ගයන්න:
මුළු ලොවට ම ඒ ගැන දන්වන්න.

සියොන් වැසි සියල්ලෙනි, මොරගසා ගී ගයන්න:
ඉශ්රායෙල් ශුද්ධ දෙවිඳාණන් උතුම් වන බැවින් ද
සිය සෙනග අතරේ වැඩ සිටින බැවින් ද
සතුටින් හඬ නගා ගී ගයන්න."

## සුපුවත් ජය නද ලූක් 1: 45

ආලේලූයා! ආලේලූයා!
සමිඳාණන් වහන්සේගේ නාමයෙන් තමන් හට දුන් පොරොන්දුව
ඉටුවන්නේ ම යයි විශ්වාස කළ තැනැත්ති භාග්‍යවන්ති ය.
ආලේලූයා!

## සුවිශේෂය ලූක් 1: 39–56

*සුවිශේෂක ලූක් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

"මාගේ ස්වාමින් වහන්සේගේ මෑණියන් මා වෙත පැමිණීමට තරම් මා කවරෙක් ද?."

දින ගණනකට පසු මරිය තුමිය නැගිට ජුදා කඳුකරයෙහි නුවරකට යුහු ව ගොස්, සෙකරියස්ගේ ගෙට ඇතුළු වී, එලිසබෙත් හට ආචාර කළා ය. එලිසබෙත් මරිය තුමියගේ ආචාර බස් ඇසූ කළ ඇගේ කුසෙහි දරුවා ඉපිලෙන්නට වන. එවිට එලිසබෙත් ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ ව, මහ හඬින් උදන් අනමින්,

"ඔබ වනිතාවන් අතර අතිශයින් ආශිර්වාද ලද්දී ය. ඔබ කුස ඔත් දරු ඵලය ද ආශිර්වාද ලද්දේ ය. මාගේ සමිඳණන් වහන්සේගේ මෑණියන් මා වෙත පැමිණීමට තරම් මම කවරෙක් ද? මක්නිසා ද ඔබේ ආචාර හඬ මා සවන් ගත වූ කෙණෙහි ම මා කුසෙහි දරුවා ප්‍රීතියෙන් ඉපිලී ගියේ ය. සමිඳණන් වහන්සේගේ නාමයෙන් තමන් හට දුන් පොරොන්දුව ඉටුවන්නේ ම යයි විශ්වාස කළ තැනැත්ති භාග්‍යවන්තය යි" කීවා ය. එවිට මරිය තුමී මෙසේ උදන් ඇනුවාය:

"මාගේ හද සමිඳුන් උසස් ලෙස පසසයි, මාගේ ආත්මය මා මිදුම්කාර දෙවිඳුන් ගැන උදන් අනයි: මක්නිසා ද, එතුමාණෝ සිය දාසිය ගේ දීනතාව කුළුණු පාමින් සලකා වදාළ සේක.

හැම පරපුරක් ම මෙතැන් සිට 'භාග්‍යවන්තී ය'යි මට කියනු ඇත.

පරාක්‍රමයාණෝ මා උදෙසා මහත් දේ කළ සේක.
'පරිශුද්ධයාණෝ' යනු එතුමන්ගේ නාමය ය.

එතුමන්ගේ දයාව සිය බැතිමතුන් කෙරේ, පරපුරෙන් පරපුරට පැතිරේ.

සිය බාහුවෙන් එතුමාණෝ විකුම් පා, උඩඟු උදම් සිතැත්තන් විසුරුවා හැර, මහ නරපතීන් සිය සිහසුන්වලින් පහත හෙළා, දීනයන් ඉහළ නංවා උසස් කළ සේක.

සාගිනි වූවන් යහපත් දෙයින් සතප්වා, ධනවතුන් හිස් අතින් හරවා යැවූ සේක.

අප පියවරුන් වූ, ආබ්‍රහම්ට හා එම පරපුරට, සඳහට ම පොරොන්දු වූ දයාව සිහි කරමින් සිය සේවක ඉශ්රායෙල් සෙනඟ හට, පිහිට වූ සේක."

මරිය තුමී, එළිසබෙත් සමඟ තෙමසක් පමණ නැවතී සිට සිය නිවසට පෙරළා ගියා ය.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*